**සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල - 2018**

**-----------------------------------------------------------------**

**1.1 මතය**

**------**

සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**-----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වා ගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

**--------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 175,229,171 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 142,111,051 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 33,118,120 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ ආයෝජන පොලී ආදායම රු. 9,328, 355 කින් වැඩිවීම සහ මුළු වියදම් රු. 28,782,765 කින් අඩු විම මෙම වර්ධනයට හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 876(3) ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වාගෙනයාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කලයුතු බව දැක්වෙතත්, අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු නොකර කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද රෙගුලාසිමාලාව අනුව මේ දක්වා එහි කටයුතු පවත්වාගෙන යමින් තිබුණි. | අරමුදල පවත්වාගෙනයාමට අවශ්‍ය නීති, රෙගුලාසි මාලා සකස්කර නිති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවට යොමුකර ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

### 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2002 හා 2005 වර්ෂවලදී මිලදීගත් රු. 1,533,980 ක් වටිනා භාවිතයෙන් බැහැරව තිබූ පරිගණක අපහරණය කිරීමටත්, 2012 වර්ෂයේදී මිලදීගත් රු. 835,588 ක් වටිනා පරිගණක සම්බන්ධයෙන් ධාරණ අගය නිශ්චය කිරීමටත් කටයුතු කර නොතිබුණි. | භාවිතයෙන් බැහැරව තිබූ පරිගණක කිහිපයක් වෙන්දේසි කර ඇති අතර ඇතැම් පරිගණක කිහිපයක් අපහරනය කිරීමට නියමිතව ඇත. ඉතිරි පරිගණක ධාරණ අගය නිශ්චයකර 2019 වර්ෂයට අදාලව ගිණුම් ගතකිරිමට කටයුතු කර ඇත. | භාවිතයෙන් බැහැරවූ පරිගණක අපහරණය කිරීමටත් අනෙකුත් පරිගණක සම්බන්ධයෙන් ධාරණ අගය නිශ්චය කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 3.3 කාර්යසාධනය

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 හා 2018 වර්ෂවලදී දිනුම් අදින ලද ලොතරැයි දිනුම්ලාභීන් 159 දෙනෙකුට හිමි ත්‍යාග මුදල රු.31,800,000 ක් ප්‍රතිලාභියා මියයාම, ත්‍යාගලාභියා සහනාධාරලාභියකු නොවීම, විදේශගතවීම, තොරතුරු සොයාගත නොහැකිවීම, පදිංචිය හැරයාම, එක්වරක් දිනුම් ලබාගත් ප්‍රතිලාභීන් නැවත දිනුම් ඇදිම සඳහා නිශ්චිත කාලපරිච්ඡේදයකට නවතා තැබීමේ ක්‍රමවේදයක් වශයෙන් නිශ්චිත කාලපරිච්ඡේදයක් සදහා දත්ත පද්ධතිය තුලින් ප්‍රතිලාභීන්ගේ නම් ඉවත් කිරිමට කටයුතු නොකිරීම යනාදී විවිධ හේතු මත දිස්ත්‍රික් කාර්යාල වලින් ත්‍යාග මුදල් ආපසු එවා තිබුණි. | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවලින් නිවැරදි තොරතුරු වාර්තා නොවීම මත දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ ගැටළු මතු වී ඇත. | අරමුදලේ පරමාර්ථ ඉටුකිරිමට හැකි අයුරින් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අරමුදලේ රෙගුලාසි අංක 17 ප්‍රකාරව සෑම දිනුම් ඇදීමක් සිදු කිරීමට පෙර ඒ ඒ මාසයේ සමෘද්ධි සහනාධාරයෙන් ඉවත්වූ සහ නව සහනාධාරලාභීන්ගේ තොරතුරු පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2018 වසර දක්වා වර්ෂ 07 කදී ත්‍යාගලාභී වු ප්‍රතිලාභීන් | මාස 06 කට වරක් යාවත්කාලීන කරනු ලබන අතර අන් අවස්ථාවලදී නිවැරදි ආකාරයට දත්ත පද්ධතිය යාවත්කාලීන නොවූ බව පිළිගනු ලැබේ. | අරමුදලේ රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකළ යුතු අතර දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 709 කට හිමි රු. 128,550,000 ක් වූ ත්‍යාග මුදල් ප්‍රදානය කිරීමට නොහැකිවී තිබුණි. | | |
| (ඇ) අරමුදලේ රෙගුලාසි අංක 26 ප්‍රකාරව සෑම දිනුම් ඇදීමකින් පසු මාස 03 ක් ඉක්මවා යෑමට පෙර කොන්දේසි සපුරා ඇති ජයග්‍රාහී ප්‍රතිලාභීන් වෙත අදාල ත්‍යාග මුදල් ලබාදිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාව අනුව ප්‍රතිලාභියාට ත්‍යාග මුදල් ලැබීමේ ප්‍රමාදය දිනුම් අදින ලද දින සිට මාස 03 ක සිට මාස 14 ක් දක්වා කාලයක් ගතවී තිබීමෙන් අරමුදලේ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | ප්‍රතිපාදන මාස 3 ක් ඇතුලත ලබාදිමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල දැනුවත් කර ඇත. | අරමුදලේ රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) රෙගුලාසි අංක 8 ප්‍රකාරව ජයග්‍රාහී ප්‍රතිලාභීන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා සුදුසු ව්‍යාපෘතිවලට යොමු කිරීම අරමුදලේ පරමාර්ථයක් වුවද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිවාස ලොතරැයි දිනුම් ඇදිමේ වැඩසටහනට පරිබාහිරව විශේෂ නිවාස වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. | අරමුදලේ රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 අරමුණුවලට පටහැනිව අරමුදල් උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)විශේෂ අවධානය යොමු කළයුතු අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකිරීම වෙනුවෙන් සමෘද්ධිලාභීන්ගේ මාසික දායකත්වයෙන් ගොඩනැඟී ඇති මෙම අරමුදලින් සමෘද්ධිලාභීන් නොවන පුද්ගලයින් 16 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී දිනුම් ඇදීමකින් තොරව රු. 3,100,000 ක් වැය කර තිබුණි. | අඩු ආදායම්ලාභීන් දත්ත පද්ධතියට ඇතුළත් කර නැත. | දත්ත පද්ධතිය ක්‍රමවත් හා යාවත්කාලීන කළ යුතුය. |
| (ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නඟුල් එළිය ගම්මානය අඩු ආදායම්ලාභි ධීවර පවුල් 26 ක් සඳහා "සමෘද්ධි නිවාස වාසනා" වැඩසටහන සඳහා අරමුදලේ රෙගුලාසි මාලාවෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේදී රු. 5,688,000 ක්ද ගෙවා තිබුණු අතර මෙම නිවාසලාභීන් තුළ සමෘද්ධිලාභීන් මෙන්ම සමෘද්ධිලාභීන් නොවන පවුල් ද විය. | අරමුදලට හානියක් නොවන පරිදි නිවාස අවශ්‍යතා සපුරාලීමට නිවාස ලොතරැයි හරකාර මණ්ඩලයට බලය ඇත. | අරමුණු, පරමාර්ථ හා අරමුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුලත් කළ මුදල් රෙගුලාසි 877(2)(ඈ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වර්ෂයෙන් වර්ෂය විගණනය කිරිමෙන් පසු ඉදිරිපත් කරන ලෙස දන්වන ලදි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 විගණන කමිටු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටුවේදීවත් අරමුදලට අදාළ විගණන නිරීක්ෂණ සාකච්ඡාවට භාජනය කර නොතිබුණි. | විගණන හා කළමනාකරන කමිටුවලදී නිරන්තරයෙන් සාකච්ඡා විය. | විගණන හා කළමනාකරණ කමිටුවල අවධානය යොමුකිරීමට කටයුතු කළ යුතුය. |

### 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයේ ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877(1) (ඈ) ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි. | අරමුදල සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන තීරණ මත ඉදිරි කටයුතු සිදුකරන ලැබේ. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |